කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (නව නිර්දේශය)

# සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH – E 2015

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

## 1 කොටස

01. පහත සඳහන් ඡේදවල අදහස ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

(අ.) රහසොඬආදීහුද් ඇයගේ පරිජනයෝද් "සැඬොල්හු නිසා රහමස්ගඳමල් ආදී වළඳ කරණු නො ලදුම්හ. ඔහු ගත මැනැවැ" යි ගොස් නිවරද මාකාඬග පණ්ඩිතයා තර්ජන කෙරෙමින් කෙහෙයෙහි ගෙණ බිම පැහැර හෙළාපිය විළුඹින් වැලමිටින්පහණින් තළා 'මළහයි' යි සිතා පය ගෙණ ඇදැ කසළගොඩැ දමාපියා ගියෝ මහසත් සන්න ලදින් අත්පා පිරිමැද "මෙ දුක් මට දිට්ඨමඞ්ගලිකාව නිසා උපන්නේය. ඉදින් මම් පිරිමියෙකිම් වීම් නම්, ඇ මට පාදපරිචාරිකා කරවීමි" යි සිතා වෙවුලමින් ඇය ගෙට ගොස් "දිට්ඨමඞ්ගලිකාව ලද හොත් මෙ තෙනින් නැඟෙමි. නො ලද, මෙහි ම හෙවැ මියෙමි" ගෙඅඟණයෙහි හොති. එ සමාහි දඹදිවැ "යමක්හුගේ ගබ්දොර සැඬලෙක් දැහැවැ හෙවැ මෙළේ වී නම්, යම් කෙනෙක් එ ගබ වෙසෙද්ද, ඔහු හැම සැඬොල් වෙති. ගෙමැද හෙව මෙළේ වී නම්, ගෙවැස්සෝ හැම දෙන මැ සැඬොල් වෙති." දොරැ හෙවැ මෙළේ වී නම්, දෙ එග්බිති ගෙහි ඇත්තෝ සැඬොල් වෙති. ගෙඅඟණෙහි හෙවැ මෙළේ වී නම්, දෙපයින් සත් සත් ගේ බැවින් තුදුස් ගෙකෙක මිනිස්සු සැඬොල් වෙති." යන ව්‍යවස්ථායි මහසත් වනාහි ගෙඅඟණයෙහි හොත්තේ යි.

(ලකුණු 10)

(ආ) එවේලෙහි බුදුහු "මේ වේලෙහි මොහුගේ ජවය ද දර්පය ද සිඳී ගියේ යැ. මෙවිටැ මා හා බණන්නට සුදුසුකලැ" යි සිතා වදාරා "ඇපි සිටියම්හ. තෝ සිට" යි වදාළාහැ. එබස් ඇසූ සොරතෙම 'මහණ තපස්වීහු නම් බොරු නො කියන්නාහැ. තෝ යෙමින් සිටැ මා සිටි තැනැත්වුට කුමක් පිණිස 'ඇපි සිටියම්හ තෝ සිට'යි කියයි ද?"යි බිණියැ. එබස් ඇසූ ස්වාමිදරුවානෝ "මෙවිටැ මා වූ නියාව හඳුන්වා බණ කියම්හ" සිතා වදාරා මතැතක්හු පෙරළී සිටිනා සේ පෙරළී සිටැ "බණ කියමි" සිතු සිත හා එක් ව මැ නොයෙක් වර්ණයෙන් යුක්ත වූ සිතියමින් ගැවැසී ගත් පෙත්තක් විදහා පා ලන්නා සේ සර්වාඞ්ගයෙහි සඟවා ගෙණැ වැඩි දෙතිස් මහාපුරුෂලක්‍ෂණ අශීත්‍යනුබ්‍යඤ්ජනකෙතුමාලාබ්‍යාමප්‍රබා, එක පැහැරැ සඳැස්පිල් විදහන ස්වර්ණමයූර රාජයා සේ, එක පැහැරැ විදහා බුදුරුව දක්වා ඔහු ඇස් නිවා, දැලූ වූ ශ්‍රී මුඛයෙන් නික්මුනු සුගන්ධයෙන් සියලු වනලැහැබ එක සඳුන්කරඬුවක් සේ එකකපුරුවිතක් සේ සුවඳ කෙරෙමින්, වන දෙවතාවන් කරන සාධුකාරයෙන් සියලු වනය එකකොලාහල කෙරෙමින් බණට පටන් ගත්හැ.

(ලකුණු 10)

02. පොළොන්නරු යුගයේ ගද්‍ය සාහිත්‍යයේ විශේෂතා සනිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

03. බුත්සරණේ ඇතුළත් භක්ති කාව්‍ය ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

නැතහොත්

පහත සඳහන් කෘති අතරින් එකක් පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(අ) ධර්මප්‍රදීපිකාව
(ආ) අමාවතුර
(ඇ) සද්ධර්මරත්නාවලිය

## 11 කොටස

04. සිංහල නවකතාවේ ප්‍රභවයට හේතු වූ සමාජ, දේශපාලන හා ආර්ථික පසුබිම කෙබඳු දැයි විභාග කරන්න.

05. "බැද්දේගම නවකතාවෙහි බ්‍රිතාන්‍ය යටත්විජිතකරණය හේතුවෙන් මෙරට ජනයා අත්විඳි පීඩනය යථාර්ථවත් ව හා කලාත්මක ව නිර්මිතය." සනිදර්ශන ව පරීක්ෂා කරන්න.

06. දියමන්ති මාලය කෙටිකතා සංග්‍රහයෙහි ඇතුළත් කෙටිකතා අතරින් ඔබ කැමති එක් කෙටිකතාවක් පිළිබඳ විවරයක් කරන්න.

## 111 කොටස

07. ශාකුන්තලය නාට්‍යයෙහි ඇතුළත් චරිත නිරූපණයේ ප්‍රබලතා පිළිබඳ සනිදර්ශනාත්මක විග්‍රහයක් කරන්න.

නැතහොත්

ශාකුන්තලය නාට්‍යයෙහි ඇතුළත් ධ්වනිපූර්ණ භාෂා භාවිතය පිළිබඳ නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.

08. ඇරිස්ටොෆනීස්ගේ මැඩියෝ නාට්‍යයෙහි විග්‍රහ වන සමකාලීන සමාජ යථාර්ථය කෙබඳු දැයි උදාහරණ සහිත ව පරීක්ෂා කරන්න.

09. "සිනමාව එයට ම අනන්‍ය ලක්ෂණවලින් පුසැදි ස්වාධීන කලාවකි." සනිදර්ශන ව විභාග කරන්න.

10. "සමාජ ආර්ථික විෂමතා හේතුවෙන් පීඩිත කාලීන තරුණ ප්‍රජාවගේ ජීවන අරගලය පාර දිගේ චිත්‍රපටයෙහි අතිශය සිනමානුරූපීව නිරූපිතය." විභාග කරන්න.

(2 සිට 10 දක්වා පිළිතුරුවලට ලකුණු 20 බැගිනි.)

*******************************